ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය எனது இல. My No.	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date 2026 · 10 · 12

ඩබ්ලිව්.කේ.පී.අයි.රොද්‍රිගෝ මහතා,
අංක : 1057/4/R, 4 වන වීදිය,
අමරගොඩ පාර, පොතුආරාව,
මාලබේ.

පැමිණිලි පාර්ශවය

ප්‍ර.පො.ප. සී.යූ.ඩී.කත්‍රිආරච්චි මහතා,
ස්ථානාධිපති (පාලන),
පොලිස් ස්ථානය, බියගම.

වගඋත්තර පාර්ශවය

පැමිණිලි අංකය : HRC/1429/22

පැමිණිල්ල :

ඉහත පැමිණිලිකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා පදිංචිව සිටින කුලී නිවසේ අයිතිකරු සමඟ ආරවුලක් පැවති බවත්, 2022.05.09 වන දින උදෑසන 5 ට පමණ නිවසේ විදුලිය විසන්ධි වූ බවත්, ඒ පිළිබඳව පරික්ෂා කිරීමට දොර ඇරීමේදී තමාට බිම දමාගෙන පහරදුන් බවත්ය.

ඒ පිළිබඳව පැමිණිලි කිරීමට තමා පොලිසියට ගිය බවත්, නිවසේ ඇති තමාගේ භාණ්ඩ ආරක්ෂා කරන දෙන ලෙසට පොලිසියෙන් ඉල්ලා සිටි බවත්, ඒ අවස්ථාවේදී තමාගේ පැමිණිල්ල සටහන් කර නොගත් බවත්, නිවසේ හිමිකරු වන ක්ලෙමන් ප්‍රනාන්දු යන අය ද ඒ වනවිට පොලිස් ස්ථානයට පැමිණ සිටි බවත්ය. ඉන්පසුව පොලිස් නිලධාරින් නිවෙස් හිමිකරු සමඟ කථා කර තමාගේ පැමිණිල්ල අසත්‍ය පැමිණිල්ලක් බවට ප්‍රකාශ කළ බවත්ය. ඒ අනුව තමා නැවත නිවසට යනවිට නිවසේ මැර පිරිසක් සිට ඇත. එමනිසා පැමිණිලිකරු නැවත පොලිස් ස්ථානයට පැමිණිය ද තමාගේ පැමිණිල්ල සටහන් නොකළ බව සඳහන් කරයි. එමනිසා පැමිණිලිකරු පොලිස්පතිවරයාට දුරකථනයෙන් දැනුම්දීමෙන් පසුව උදේ 7.30 ට පමණ නැවත පොලිස් ස්ථානයට ගිය බවත්, ඒ අවස්ථාවේදී ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලිකරුව බිත්තියට හේත්තු කර දුරකථනය උදුරාගත් බවත්, කමිසය ඉරා තමාගේ හිසට, වම් අතට සහ වම් කකුලට පහරදුන් බවත්ය.

පසුව තමාගේ පැමිණිල්ල සටහන් කරන අවස්ථාවේදී පොලිසියෙන් පහරදුන් බවට ප්‍රකාශ කලත් ඒ පිළිබඳව සටහන් නොකල බවත්, පසුව අධිකරණ වෛද්‍ය පෝරමයක් ලබාදුන් බවත්, ඒ අනුව තමා තලංගම කොස්වත්ත රෝහලට ඇතුළත් වී 2022.05.12 දින තෙක් නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවයි.

ප්‍රධාන කාර්යාලය பிரதான அலுவலகம் Head Office	අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. இல. 14, ஆர். ஏ. டி. மெல் மாவத்தை, கொழும்பு 04. No. 14, R. A. De Mel Mawatha, Colombo 04.	සභාපති தவிசாளர் Chairman	011 - 250 5451	ෆැක්ස් தொலைநகல் Fax	011 - 250 5541/74
දුරකථනය தொலைபேசி Telephone	94-11-250 5580 / 81 / 82	ලේකම් செயலாளர் Secretary	011 - 250 5521	ක්ෂණික துரித அழைப்பு Hotline	1996

ඊමේල් / மின்னஞ்சல் / E-mail: secretary@hrcsl.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

2022.05.12 දින රෝහලෙන් පිටවීමෙන් පසුව මාලබේ පොලිස් ස්ථානයට ගොස් සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති හමුවීමෙන් පසු නැවත තමා රැදී සිටි නිවසට ගියවිට නිවෙස් හිමියා නිවසට පැමිණ සිටි නිසා ආරවුලක් ඇතිවේ යැයි සිතූ බැවින්, නැවත පොලිස් ස්ථානයට පැමිණ සුළු පැමිණිලි අංශයේ රැදී සිටි බවයි. නිවෙස් හිමියා පස්වරු 2.30ට එන බැවින් ඒ වනතෙක් පොලිස් ස්ථානයේ රැදී සිටින ලෙසට සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා විසින් තමාට දැනුම් දුන් බව ප්‍රකාශ කරයි.

එසේ පොලිස් ස්ථානයේ රැදී සිටින විට ස්ථානාධිපති ප්‍ර.පො.ප. කත්‍රිආරච්චි මහතා පොලිස් ස්ථානයට පැමිණි බවත්, පැමිණිලිකරුට අතින් පයින් පහර දුන් බවත්, "උඹේ පැමිණිල්ල විභාග කරන්නේ නැහැ. පලයන් "කියා කෑ ගසා වම් කකුලේ ඇඟිල්ල සපත්තුවෙන් පාගා තමාව එළවා දැමූ බවත්ය. ඉන්පසුව එදින පස්වරු 4.30 ට පමණ තමා ජාතික රෝහල වෙත ගොස් 2022.05.13 දින තෙක් නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>අධිකරණ වෛද්‍ය වාර්තා</u> :

පැමිණිලිකරු සඳහන් කරන පළමු පහරදීම සනාථ කිරීම සඳහා තලංගම කොස්වත්ත රෝහලෙන් අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇත. ඒ අනුව අධිකරණ වෛද්‍ය පෝරම අංක 319/22 යටතේ පැමිණිලිකරු 2022.05.09 දින තලංගම දිස්ත්‍රික් රෝහල වෙත ඇතුළත් වී ඇති අතර, 2022.05.12 දින දක්වා ප්‍රතිකාර ලබාගෙන රෝහලෙන් පිටව ගොස් ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව කිසිදු තුවාලයක් නිරීක්ෂණය නොවන බවට දක්වා ඇත.

දෙවන දින එනම්, 2022.05.12 දින පහරදීම සනාථ කිරීම සඳහා කොළඹ ජාතික රෝහලෙන් අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර, අධිකරණ වෛද්‍ය පෝරම අංක 5602 යටතේ ලබාදී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පැමිණිලිකරු එදින පස්වරු 4.45 ට රෝහලට ඇතුළත්වී ඇති අතර, 2022.05.16 දින පෙරවරු 10.00 ට රෝහලෙන් පිටව ගොස් ඇත. එම වෛද්‍ය වාර්තාව අනුව බරපතල නොවන තුවාල 1, 2 සහ 3a, 3b, 3c, 3d, 3e, 3f ලෙස දක්වා ඇත. එනම්,

1. හිසෙහි වම් පැත්තේ පිටුපස 0.5 x 0.5 cm ප්‍රමාණයේ සීරීම් තුවාලයක් ද,
2. තොලෙහි සීරීම් තුවාල කිහිපයක් ද,

3a. මධ්‍යම ප්‍රමාණයේ මුහුණෙහි වම් පැත්තේ තැලීමක් ද,
3b. බෙල්ලේ දකුණු පැත්තේ තැලීමක් ද,
3c. වම් පැත්තේ පහළ උදරයේ තැල්මක් ද,
3d. වම් පාදයේ තැල්මක් ද,
3e. හිස පිටුපස තැල්මක් ද,
3f.වම් අතේ පිටුපස තැල්මක් ද වශයෙන් දක්වා ඇත.

<u>වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම</u> :

ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරිවරයාගෙන් අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවා ඇති අතර, එම වාර්තාවේ දක්වා ඇත්තේ, පැමිණිලිකරු විසින් මාලබේ පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලට අදාළව ක්‍රියාමාර්ගයක් නොගැනීම සහ මාලබේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප.කත්‍රිආරච්චි නිලධාරියා පහරදී ඇති බවට පොලිස් සහන මැදිරියට කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර ඇති බවයි.

මේ සම්බන්ධයෙන් බස්නාහිර පළාත (දකුණ) නියෝජ්‍ය පොලිස්පතිවරයා වාර්තාවක් ලබාදී ඇත. එම වාර්තාව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (බස්නාහිර) වෙත ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාවට අනුව පැමිණිලිකාර රොද්‍රිගෝ යන අය විසින් තමා පදිංචිව සිටි කුලී නිවසින් පන්නා දැමීම සම්බන්ධයෙන් සිදුකර ඇති පැමිණිල්ලට අදාළව මාලබේ පොලිසිය විසින් අදාළ විත්තිකාර කුලී නිවෙස් හිමිකරු වන නීල් නිව්ටන් ක්ලෙමන් ප්‍රනාන්දු යන අයව අත්අඩංගුවට ගෙන අංක බී 50722/22 යටතේ නිවසකට අයුතු ඇතුළුවීම සහ පුද්ගලයෙකුට අතින් පයින් පහරදීම යන චෝදනා සම්බන්ධයෙන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවයි. එසේම ස්ථානාධිපතිවරයා පහරදීමක් සිදුකළ බවට කරුණු අනාවරණය නොවන බවත් එම වාර්තාවේ වැඩිදුරටත් දක්වා ඇත.

- **වගඋත්තරකාර ප්‍ර.පො.ප. කත්රිආරච්චි මහතාගේ කරුණු දැක්වීම :**

සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිල්ලේ වගඋත්තරකරු ලෙස නම් කර ඇති ප්‍ර.පො.ප. අයි.ඩී.කස්තුරිආරච්චි මහතා කොමිෂන් සභාව ඉදිරියේ කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු කුලී නිවෙස් හිමියා සමඟ මාස කිහිපයක් තිස්සේ නිවස සම්බන්ධයෙන් ආරවුලක් පැවති බවත්, පැමිණිලිකරු ඒ සම්බන්ධයෙන් පැමිණිලි දෙකක් පොලිස් ස්ථානයට යොමු කර ඇති බවත්, එම පැමිණිලි පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපතිවරයා විසින් සමථයකට පත් කර තිබූ බවත්ය.

2022.05.09 දින මෙම පැමිණිලිකරු උදෑසන 5.00 – 6.00 ත් අතර පොලිස් ස්ථානයට පැමිණ තිබූ බවත්, එම අවස්ථාව උපසේවය භාරගන්නා සහ භාරදෙන කාල සීමාව වූ බැවින්, උපසේවා නිලධාරියා එම රාජකාරි අවසන් වනතුරු මද වේලාවක් රැඳී සිටින ලෙසට පැමිණිලිකරුට දැනුම් දී තිබූ බවත්, එසේ තිබියදි පැමිණිල්ලක් නොකර ස්ථානයෙන් පිටව ගොස් තිබූ බවට අදාළ නිලධාරින් තමා වෙත පැවසූ බවයි. එදින උදෑසන තමා 4.30 – 5.00 ත් අතර ස්ථානයට පැමිණි බවත්, උදෑසන 6.30 – 7.00ත් අතර පොලිස් සහන මැදිරියේ නිලධාරියෙක් තමා වෙත දුරකථනයෙන් අමතා, පැමිණිල්ලක් කිරීමට පොලිස් ස්ථානයට පැමිණ ඇති නමුත්, එම පැමිණිල්ල භාර නොගැනීම සම්බන්ධයෙන් ප්‍රකාශ කර තිබූ බැවින්, ඒ සම්බන්ධයෙන් විමසීම් කිරීමේදී උපසේවය භාරගන්නා අවස්ථාවේදි එවැනි පැමිණිල්ලක් ලැබී තිබූ බවත්, එම රාජකාරි අවසන් වනතුරු රැඳී සිටින ලෙසට පැමිණිල්ල කිරීමට පැමිණි පුද්ගලයාට දැනුම් දුන්නද, එම තැනැත්තා පොලිසියෙන් පිටව ගොස් ඇති බවට තමා විසින් පොලිස් සහන මැදිරියෙන් විමසීම් කළ නිලධාරියාට දැනුම්දුන් බවත්, ඒ සම්බන්ධයෙන් පොලිස් ස්ථානයේ සටහන් යොදා ඇති බව ප්‍රකාශ කළ බව ද සඳහන් කරයි.

පසුව එදින උදෑසන 7.00 ට පමණ පැමිණිලිකරු පොලිස් ස්ථානයට පැමිණ තමා හමුවූ බවත්, තමා උපසේවා නිලධාරියාට එම පැමිණිල්ල සටහන් කර ගන්නා ලෙසට උපදෙස් ලබාදුන් බවත්ය. එසේම එදින 119 රාජකාරි කරන ලද නිලධාරියාට අදාළ ස්ථානයට ගොස් පරීක්ෂා කරන ලෙසට උපදෙස් දුන් බවත්, පැමිණිලිකරුට රෝහල් ගත වීම සඳහා අධිකරණ වෛද්‍ය පෝරමයක් ද ලබාදුන් බව වැඩිදුරටත් සඳහන් කරයි. 119 නිලධාරියා එම ස්ථානයට ගොස් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර අවට අයගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමක් සිදුකර ඇති අතර, පැමිණිලිකරු තමාගේ භාණ්ඩ එළියට දමාගෙන ලොරියක් එනතුරු බලා සිටි බවට එහිදී කරුණු ඉදිරිපත්වී ඇති බවයි.

පැමිණිලිකරුට පහරදීම සම්බන්ධයෙන් පැමිණිලිකරු සිදුකරන ලද පැමිණිල්ලට අනුව, සැකකාර නිවෙස් හිමිකරු අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත්, 2022.05.12 දින තමා රාජකාරියේ යෙදී සිටි බවත්, මෙම පැමිණිලිකරු තමාව හමු නොවූ බවත්, එදින තමා විසින් පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදු නොකළ බවත්, එම චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, පැමිණිලිකරුගේ අවශ්‍යතාවය

ඉටු නොවීම හේතුවෙන් මෙසේ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇති බව වගඋත්තරකරු වැඩිදුරටත් කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත.

2022.05.12 දින මෙම පැමිණිලිකරුට පහරදීමක් සිදුවූ බැවින්, ජාතික රෝහලට ගොස් ප්‍රතිකාර ලබාගත් බවට පැමිණිල්ලේ දක්වා ඇති බැවින් හා අධිකරණ වෛද්‍ය වර්තාව අනුව බරපතල නොවන තුවාල ඇති බවට සටහන්ව ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරුගෙන් කරුණු විමසන ලදි. ඒ අනුව වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරුට 2022.05.09 දින නිවෙස් හිමිකරු සහ පොලිසිය පහරදුන් බවට පැමිණිල්ලක් කරමින් රෝහල් ගත වී ඇති බවත්, නමුත් තමා විසින් එම චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, පහරදීමක් සිදුකර ඇත්නම් එම පහරදීම සිදුකර ඇත්තේ අදාළ කුලී නිවෙස් හිමියා බවත්ය.

2022.05.09 දින පැමිණිලිකරු සිදුකරන ලද පැමිණිල්ලට අනුව සැකකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ මාසයකට පසුව වන අතර, එයට හේතුව කොමිෂන් සභාව විසින් වගඋත්තරකරුගෙන් විමසා ඇති අතර, වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, එම වකවානුවේ රටේ පැවති නොසන්සුන්කාරි තත්ත්වය මත තම පොලිස් බල ප්‍රෙද්ශයේ සිදුවීම් 11 වාර්තා වී තිබු බවත්, ඒ සඳහා නිලධාරින් යෙදවීමට තිබු බැවින් සැකකරු අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ බවයි.

<u>නිරීක්ෂණ</u> :

- මෙම පැමිණිල්ලට අනුව අවස්ථා දෙකකදී පැමිණිලිකරුට පහරදීමේ සිද්ධි දෙකක් සිදුව ඇති බවට වාර්තා වේ.

- පැමිණිල්ල අනුව 2022.05.09 දින උදෑසන 5.00 ට පමණ කුලී නිවෙස් හිමියා ඇතුළු පිරිසක් පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති අතර, ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට එදින උදෑසන පොලිස් ස්ථානයට ගිය බවත්, පොලිසිය එම පැමිණිල්ල භාර නොගත් බවත්, පසුව ඒ බව පොලිස්පතිතුමාට දන්වා නැවත පොලිස් ස්ථානයට ගිය බවත්, ඒ අවස්ථාවේදී එනම්, උදේ 7.30 ට පමණ ස්ථානාධිපතිවරයා පැමිණිලිකරුව බිත්තියට හේත්තු කර දුරකථනය උදුරාගෙන කමිසය ඉරා පහරදුන් බවත් දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු එදින තලංගම රෝහලට ගොස් 2022.05.12 දින දක්වා නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

- එසේම නැවත 2022.05.12 දින මාලබේ පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේදී එදින මාලබේ ස්ථානාධිපතිවරයා තමාගේ කකුල පාගා අතින් පයින් පහරදුන් බවට පැමිණිල්ලේ දක්වා ඇති බවට නිරීක්ෂණය වේ.

- 2022.05.09 දිනැතිව සිදුවූවා යැයි කියන ලද පහරදීම තහවුරු කිරීම සඳහා අධිකරණ වෛද්‍ය පිරික්සුම් පත්‍ර අංක 319/2022 යටතේ අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇත. එම අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියා විසින් ලබාදෙන ලද කෙටි ඉතිහාසය අනුව, නිවෙස් හිමිකරු තමාට පහරදුන් බවත්, පොලිස් ස්ථානයේ කිසිවෙකු ඔහුට පහරදීමක් සිදු නොකළ බවත් දක්වා ඇති නිරීක්ෂණය වේ.

- එම වෛද්‍ය වාර්තාව අනුව, පැමිණිලිකරුගේ සිරුර පුරා වේදනාවක් පවතින බව සඳහන් කළ ද, වෛද්‍ය පරීක්ෂණයේදී සිරුරේ තුවාල කිසිවක් නිරීක්ෂණය නොවූ බව දක්වා ඇත.

- පැමිණිලිකරු පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු සහ වෛද්‍ය වාර්තාවේ රෝගියා විසින් ලබාදෙන කෙටි ඉතිහාසයේ සඳහන් කරුණු අතර පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය වන අතර, 319/22 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව පළමු සිදුවීම තුළ පහරදීමක් සිදුව ඇති බවට තහවුරු නොවන බව නිරීක්ෂණය වේ.

- 2022.05.12 දින සිදුවූවා යැයි කියනු ලබන පහරදීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය පෝරම අංක 5602 හා 2022.05.12 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව, රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ දක්වා ඇත්තේ මාලබේ පොලිස් ස්ථානයේ ප්‍ර.පො.ප. කස්තුරිආරච්චි මහතා විසින් 2022.05.12 දින සවස 2.30 ට පමණ පොලිසිය තුළදී අතින් පයින් කිහිප අවස්ථාවකදීම පහරදුන් බවයි. එම වෛද්‍ය වාර්තාව අනුව, 1, 2 වශයෙන් තුවාල දෙකක් දක්නට ඇති අතර, තුවාල අංක 3 වශයෙන් මධ්‍යම ප්‍රමාණයේ තැලීම් ඒ, බී, සී, ඩී, ඊ සහ එෆ් ලෙස දක්වා ඇත. එනම්,

    - හිසෙහි වම් පැත්තේ පිටුපස 0.5 x 0.5 cm ප්‍රමාණයේ සීරීම් තුවාලයක් ද,
    - තොලෙහි සීරීම් තුවාල කිහිපයක් ද,
    - මධ්‍යම ප්‍රමාණයේ මුහුණෙහි වම් පැත්තේ තැලීමක් ද
    - බෙල්ලේ දකුණු පැත්තේ තැලීමක් ද,
    - වම් පැත්තේ පහළ උදරයේ තැල්මක් ද
    - වම් පාදයේ තැල්මක් ද,
    - හිස පිටුපස තැල්මක් ද,
    - වම් අතේ පිටුපස තැල්මක් ද වශයෙන් වේ.

- එම තුවාල සිදුවූ ආකාරය සහ තුවාලකරු විසින් දෙන ලද ඉතිහාසය ගැලපෙන්නේ ද යන්න සම්බන්ධයෙන් වෛද්‍යවරයා මතයක් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය වේ.

- අධිකරණ වෛද්‍ය පෝරම අංක 5602 සහ 2022.05.12 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල කිහිපයක් දක්වා ඇති අතර, පැමිණිලිකරු පැමිණිල්ලේ දක්වා ඇති පරිදි සවස 2.30ට පමණ පහරදුන් බවටත්, එදිනම පෙරවරු 4.45 ට ඔහු විසින් ජාතික රෝහලට ඇතුළත් වී ඇති බවත් නිරීක්ෂණය වේ.

- වගඋත්තරකරු පහරදීම ප්‍රතික්ෂේප කරන අතර, පැමිණිලිකරු විසින් නිවෙස් හිමියා පහර දුන් බවට කරන ලද පැමිණිල්ලට අදාළව අයුතු ඇතුළුවීම සහ පුද්ගලයෙකුට අතින් පයින් පහරදීම යන චෝදනාව සම්බන්ධයෙන් නිවෙස් හිමියා අත්අඩංගුවට ගෙන නඩු පවරා ඇති බවට නිරීක්ෂණය වේ.

- ඉදිරිපත්වී ඇති කරුණු සැලකීමේදී 2022.05.09 වන දින එනම්, පළමු සිදුවීමේදී පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට පැමිණිලි කර ඇතත්, 319/22 දරණ අධිකරණ වෛද්‍ය වාර්තා අනුව එදින පහරදීමක් සිදුකර ඇති බවට කරුණු අනාවරණය නොවන බැවින්, එම සිදුවීම තුළ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවූ වී ඇති බවට අනාවරණය නොවේ.

- තවද පැමිණිලිකරුට 2022.05.12 දින පස්වරු 2.30 ට පමණ ප්‍ර.පො.ප. කත්‍රිආරච්චි මහතා පහරදුන් බවට පැමිණිලිකරු විසින් සඳහන් කර ඇති අතර, ඔහු එදිනම පස්වරු 4.45 වනවිට කොළඹ ජාතික රෝහල වෙත ඇතුළත් වී ප්‍රතිකාර ලබා ඇත. ඒ සම්බන්ධයෙන් 5602 දරණ වෛද්‍ය වාර්තාව නිකුත් කර ඇති අතර, එම වෛද්‍ය වාර්තාවේ ඉහත දක්වා ඇති ආකාරයට බරපතල නොවන තුවාල සිදුවී ඇති බවට දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරුට 2022.05.12 දින වගඋත්තරකරු පහරදුන් ආකාරය සම්බන්ධයෙන් පැමිණිල්ලේ සඳහන් කර ඇති ආකාරය හා 5602 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවේ වෛද්‍යවරයා දක්වා ඇති පරිදි තුවාල සිදුවූ ස්ථානය සහ ස්වභාවය අතර සමානකම් පවතින බවට නිරීක්ෂණය වේ.

- මෙම කාලය තුළ පැමිණිලිකරුට වෙනත් පහරදීමේ සිදුවීමක් සිදුවූ බවට වාර්තා නොවේ. ඒ අනුව 2022.05.12 දිනැති අංක 5602 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවේ පහරදීමෙන් සිදුවූ තුවාල ඇති බවට දක්වන බැවින්, පැමිණිලිකරුට වගඋත්තරකරු විසින් පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වේ.

<u>අමල් සුදත් සිල්වා එරෙහිව කොඩිතුවක්කු (1987) 2 SLR 119</u> නඩුවේදී දක්වා ඇත්තේ කිසියම් තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවයි. එසේම, 11 වන ව්‍යවස්ථාව මඟින් විධානය කරන්නේ යම් තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකු වෙත වධහිංසාවක්, කෲර හෝ අමානුෂික සැලකීමක් දැක්වීම තහනම් කරනු ලබන බවයි. එසේම, එම අයිතිවාසිකම කිසියම් සීමාවකට හෝ අඩු කිරීමකට යටත් කර නොමැති පරම මූලික අයිතිවාසිකමක් බවයි. එසේම, අපරාධකරුවෙකු වුවද, එසේ නොවුවද රටේ සෑම තැනැත්තෙකුටම මෙම අයිතිවාසිකම ඇති බවත්, රජයේ අංශයක් වන පොලිස් බලකායට වුවද, කිසියම් අවස්ථාගත කරුණක් යටතේ වුවද එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, අඩු කිරීම හෝ සීමා කිරීම නොකළ යුතු බවයි.

<u>බන්දුල සමරසේකර එදිරිව විජිත අල්විස්, ස්ථානාධිපති, ගිනිගත්හේන පොලිස් ස්ථානය (SLR 213)</u> දක්වා සිටියේ "පොලිස් නිලධාරියෙකුගේ යුතුකම වන්නේ ඔහුගේ උපරිම උත්සාහ හා හැකියාව සියලු අපරාධ වැරදි හා මහජන පීඩා වැලැක්වීමට සහ වඩාත් වැදගත් ලෙස සාමය ආරක්ෂා කිරීමට භාවිතා කිරීම බවත්, ඔහුගේ රාජකාරිය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරීමට නම්, මහජනතාවගේ විශ්වාසය හා ගෞරවයත් රඳවා තබා ගත යුතු බවත්, මහජනතාවගෙන් එවැනි විශ්වාසයක් හා ගෞරවයක් ලබාගැනීමට නම්, සාමාන්‍ය පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තු වනවාට වඩා උසස් සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් පොලිස් නිලධාරියෙකු සතු විය යුතු බවත්ය."

<u>වේලුමුරුගේසු එදිරිව නීතිපතිවරයා සහ තවත් අය (1981) 1 SLR 406</u> නඩුවේදී වනසුන්දර විනිසුරුතුමන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවට අදාළ නිර්දේශය දක්වා ඇති අතර, වධහිංසාව සහ හිරිහැර කිරීම් වලට එරෙහිව 11 වන ව්‍යවස්ථාව වෙනත් මූලික අයිතිවාසිකම් වලින් වෙන් කොට දක්වන අංග කිහිපයක් දක්වා ඇත. මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා 2/3 ක බහුතරයක් පමණක් නොව ජනමත විචාරණයක් ද අවශ්‍ය වන බැවින්, මෙම 11 වන ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම්හි වැදගත්කම තවදුරටත් සුවිශේෂිත්වයක් පෙන්නුම් කරයි.

ඉහත ඉදිරිපත්වී ඇති කරුණු සියල්ල කෙරෙහි සමස්තයක් ලෙස සලකා බැලීමේදී හා අධිකරණ වෛද්‍ය පෝරම අංක 5602 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත පහරදීමක් සිදුකර ඇති බවට තහවුරු වන බැවින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති අමානුෂික, කෲර හා අවමන් සහගත සැලකිල්ලට හෝ දඬුවමකට

භාජනය නොවීමට පැමිණිලිකරුට ඇති අයිතිය වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමන කරනු ලැබේ.

නිර්දේශය :

මෙම සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වගඋත්තර නිලධාරියා සම්බන්ධයෙන් සුදුසු නීතිමය පියවර ගැනීමට පොලිස්පති විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතුය.

2026. 11 . 19 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :01. අමාත්‍යතුමා, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, 04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ. - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

Sanda